**හාලිඇල ප්‍රාදේශීය සභාව - 2021**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

හාලිඇල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.)අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අනුව අවශ්‍යතාවය ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කර්මාන්ත 05 කට අදාළ කර්මාන්ත අතරුදවුම් මුදල් රු.172,478 ක් පොදු තැන්පත් ගිණුමට ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරගන්නා බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන ආධාර යටතේ ඉදි කරන ලද පෙර පාසැල් ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීමට අදාළව රු.389,426 ක කර්මාන්ත වටිනාකම මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු කර්මාන්ත ණය ගැති ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරගන්නා බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**1.7** **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 371( 1 ) | 2014 වර්ෂයේදි අතුරු මාර්ග 03 ක් වෙනුවෙන් අනුමත සමිති 03 කට ගෙවා තිබුණු රු.415,117 ක අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි . | අය කර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කරමින් පවතින බව සඳහන් කර ඇත. | අත්තිකාරම් පියවා ගත යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,417,043 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,808,211 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 හා 2019 වර්ෂ වල සිට පැවත එන ගෘහස්ථ වරිපනම් ඒකක 2480 ක හිඟහිටි වරිපනම් බදු රු.1,040,205 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කර ඇති බව සඳහන් කර ඇත. | හිඟහිටි වරිපනම් බදු අය කරගත යුතුය. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන වාර්ෂිකව බදු දුන් මස් කඩය, සතිපොළ සහ කඩ කාමර 38 ක හිඟ හිටි කුලී රු. 2,309,669 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | කොවිඩ් තත්ත්වය හේතුවෙන් අය කර ගැනීම ප්‍රමාද වී ඇති බව සඳහන් කර ඇත. | හිඟහිටි කුලී අය කරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශිය සභාවට අයත් උප කාර්යාල 04ක සහ කොම්පෝස්ට් අංගනයට 2021 සැප්තැම්බර් 02 දින රු.777,972 ක වියදමක් දරා CCTV කැමරා සවි කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය පරිපාලන මූලධන වැය විෂය යටතේ වෙන්කර තිබූ රු.148,000 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින්, වෙනත් වැය විෂයයන් 07 ක රු.629,972 ක ප්‍රතිපාදන භාවිතා කර තිබුණි. එකී මිලදී ගැනීම් සඳහා සභා අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර, 2021 නොවැම්බර් 17 දින මුදල් කමිටු තීරණය මත පමණක් කඩිනම් මිලදී ගැනීමක් සිදුකර තිබුණි. | සභා අනුමැතිය ලැබී ඇති බව හා ඒ අනුව මිළදී ගැනීම් සිදු කර ඇති බව සඳහන් කර ඇත. | අයවැය ප්‍රතිපාදන අනුව මිළදී ගැනීම් සිදු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මාර්ගයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.1,984,002 ක් අනුමත වී තිබුණු අතර, කර්මාන්තය ඉටු කිරීම සඳහා 2021 අගෝස්තු 31 දින රු.1,871,700 ක මුදලකට අනුමත සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2021 නොවැම්බර් 30 දින කර්මාන්තයේ වැඩ අවසන් කළ යුතු වුවද, 2022 මාර්තු 04 දින වනවිටත් වැඩ ආරම්භ කර නොතිබූ අතර, කර්මාන්තයේ ගිවිසුම් කාලය අවසන් වී දින දීර්ඝ කරගෙන නොතිබුණි. සභා අනුමැතිය සහ කාර්මික නිලධාරිගේ නිර්දේශය නොමැතිව 2021 සැප්තැම්බර් 14 දින සභා ලේකම්වරයාගේ නිර්දේශය මත රු.374,340 ක අත්තිකාරම් මුදලක් අනුමත සමිතියට ගෙවා තිබුණි. | වෙළඳපලේ භාණ්ඩ මිළ අධික ලෙස ඉහළයාම හේතුවෙන් අත්තිකාරම් ගෙවීමට සිදු වූ බව හා ඉදිරියේදී කාර්මික නිලධාරිගේ නිර්දේශය සහිතව ගෙවීම් කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | |

| | | | |
|---|---|---|---|
| (ආ) | ග්‍රාමීය හා පාසැල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය සභාව විසින් හාලිඇල ක්‍රීඩාංගණයේ පොදු වැසිකිළිය ඉදිකිරීම සඳහා දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර, අවබෝධතා ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 31 දින කර්මාන්තයේ වැඩ අවසන් කළ යුතුව තිබුණද, 2022 මාර්තු 04 දින වනවිටත් කර්මාන්තයේ භෞතික නිමි වැඩ ප්‍රගතිය සියයට 15 ක් පමණ වන අතර, ගිවිසුම් කාලය අවසන්වී තිබුණද දින දීර්ඝ කරගෙන නොතිබුණි. කාර්මික නිලධාරිගේ නිර්දේශය ලබා නොගෙන රු.618,249 ක අත්තිකාරම් මුදලක් සහ සභා අනුමැතිය නොමැතිව සහා ලේකම්ගේ නිර්දේශය මත කර්මාන්තයේ බිල්පත් සඳහා රු.373,486 ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ කොටසක් ඉදිකර ඇති අතර, ඇස්තමේන්තු සංශෝධනය කර 2022 වර්ෂයේදී අනුමත කර ගන්නා බව සඳහන් කර ඇත. | අත්තිකාරම් අය කරගත යුතුය. |